# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2144/61 – 2019 ඔක්තෝබර් 11 වැනි සිකුරාදා – 2019.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/175.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

ඩබ්ලිව්. ඒ. විජේදාස මයා, නිල්මිණි නිවස, නාගොල්ල, කුට්ටියගොල්ල, බදුල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත


1A – G 31237– 21(2019/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කැලණිය, දළුගම, පරණ නුවර පාර, අංක 123/6, එම්. ඊ. ජී. සමරවීර මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2018/175.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්ලිව්. ඒ. විජේදාස මයා, නිල්මිණි නිවස, නාගොල්ල, කුට්ටියගොල්ල, බදුල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''වයස අවු. 57 සම්පූර්ණ වීම මත 2013.10.05 දිනැතිව විශ්‍රාම ගන්වා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ ඩබ්ලිව්. ඒ. විජේදාස මහතා 2015.04.24 දින සිට ක්‍රියාත්මකවන පරිදි නැවත සේවයේ පිහිටුවුව ද, 2013.10.05 සිට 2015.04.24 දක්වා කාලයට වැටුප් නොගෙවීමෙන් ඒ මහතාට අසාධාරණයක් සිදුවී තිබේ ද? අසාධාරණයක් සිදුවී ඇත්නම් කුමන සහන හිමිවිය යුතුද ?'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 953

---

මගේ අංකය: IR/15/06/2012.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2016.09.09 වැනි දින අංක 1983/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.09.02 වැනි දින දරන නියෝගයෙන්,

සේනක මෛත්‍රී ද ලිවේරා මයා, අංක 639/6, ගුණවර්ධන මාවත, පිටකෝට්ටේ, කෝට්ටේ

සහ

රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ්, අංක 223, මොඩ්ල් ෆාම් පාර, කොළඹ 08

අතර පවත්නා 2016.07.18 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. නවරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2016.09.02 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

10 - 954/1

---

මගේ අංකය: IR/15/06/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

සේනක මෛත්‍රී ද ලිවේරා මයා, අංක 639/6, ගුණවර්ධන මාවත, පිටකෝට්ටේ, කෝට්ටේ

සහ

1. නිමල් පියරත්න මයා - සභාපති
2. අවන්බ හේරත් මයා - නායක
3. නලින් ජයතිලක මයා - සාමාන්‍යාධිකාරි
4. ඩබ්ලිව්. ඒ. කේ. ප්‍රනාන්දු මයා - උපනායක
5. නවීන් ද සිල්වා මයා - සංවර්ධන හා ඉදිකිරීම් ලේකම්
6. සංජීව වික්‍රමනායක මයා - (ගොල්ෆ් පිට්ටනි භාර) ලේකම්
7. සුරේන් මදනායක මයා - ආහාරපාන තැබෑරුම් අවන්හල හා පරීක්ෂක ලේකම්
8. සනෙත් ගමගේ මයා - භාණ්ඩාගාරික
9. වසන්ත ද සිල්වා මයා - වෙළෙඳ කටයුතු හා සංවර්ධන ලේකම්,

රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ්, අංක 223, මොඩ්ල් ෆාම් පාර, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570බී/1, පී. නවරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/06/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

සේනක මෛත්‍රී ද ලිවේරා මයා, අංක 639/6, ගුණවර්ධන මාවත, පිටකෝට්ටේ, කෝට්ටේ.

සහ

1. නිමල් පියරත්න මයා - සභාපති
2. අවන්ඛ හේරත් මයා - නායක
3. නලින් ජයතිලක මයා - සාමාන්‍යාධිකාරි
4. ඩබ්ලිව්. ඒ. කේ. ප්‍රනාන්දු මයා - උපනායක
5. නවීන් ද සිල්වා මයා - සංවර්ධන හා ඉදිකිරීම් ලේකම්
6. සංජීව වික්‍රමනායක මයා - (ගොල්ෆ් පිට්ටනි භාර) ලේකම්
7. සුරේන් මදනායක මයා - ආහාරපාන තැබෑරුම් අවන්හල හා පරීක්ෂක ලේකම්
8. සනෙත් ගමගේ මයා - භාණ්ඩාගාරික
9. වසන්ත ද සිල්වා මයා - වෙළෙඳ කටයුතු හා සංවර්ධන ලේකම්,

රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ්, අංක 223, මොඩ්ල් ෆාම් පාර, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''කොළඹ 08 මොඩ්ල් ෆාම් පාරේ, අංක 223 දරන ස්ථානයේ පිහිටි රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ් විසින් ජ්‍යෂ්ඨ කළමනාකාර (ආහාරපාන) ලෙස සේවයේ යොදවන ලද සේනක මෛත්‍රී ද ලිවේරා නමැති සේවකයා වෙනුවෙන් 2008 වර්ෂයේ අනෙකුත් සේවකයින්ට ගෙවන ලද ප්‍රසාද දීමනාව ලබා නොදීම හා 2009 ජනවාරි මස සිට අනෙකුත් සේවකයින්ට මෙන් වැටුප් වැඩි කිරීමක් ලබා නොදීම යුක්ති සහගත ද යන්නත් එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලබාදිය යුතු සහනයන් කවරේ ද''යන්නත් පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 954/2

---

මගේ අංකය:IR/COM/02/2018/52-sub.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්*

1. පී. ඒ. එම්. රත්නපාල මයා, අගන උල්පත, දඹවින්න, වැලිමඩ
2. එච්. එම්. නිමල් ශාන්ත මයා, තරිඳු නිවස, පරගහමුල, වැල්මුල්ල
3. ආර්. ඩී. මහින්ද රාජපක්ෂ මයා, වැරැල්ල පතන, දඹවින්න, වැලිමඩ
4. ලසිත සෙනරත් විජේසුන්දර මයා, අංක 111, මැදහින්න, කිණිගම, බණ්ඩාරවෙල
5. එච්. එම්. චන්දන කුමාර මයා, හංසිකා සෙවන, කුඹුක්ගොල්ල, හෙවන්වත්ත, මහියංගනය
6. ඩබ්ලිව්. ජී. ක්‍රිෂාන් විල්පොල මයා, අංක 334/1, බඹරවාන, දෙහිඅත්තකණ්ඩිය

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කැලණිය, දළුගම, පරණ නුවර පාර, අංක 123/6, එම්. ඊ. ජී. සමරවීර මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2018/52- sub.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්*

1. පී. ඒ. එම්. රත්නපාල මයා, අගන උල්පත, දඹවින්න, වැලිමඩ
2. එච්. එම්. නිමල් ශාන්ත මයා, තරිඳු නිවස, පරගහමුල, වැල්මුල්ල
3. ආර්. ඩී. මහින්ද රාජපක්ෂ මයා, වැරැල්ල පතන, දඹවින්න, වැලිමඩ
4. ලසිත සෙනරත් විජේසුන්දර මයා, අංක 111, මැදහින්න, කිණිගම, බණ්ඩාරවෙල
5. එච්. එම්. චන්දන කුමාර මයා, හංසිකා සෙවන, කුඹුක්ගොල්ල, හෙවන්වත්ත, මහියංගනය
6. ඩබ්ලිව්. ජී. ක්‍රිෂාන් විල්පොල මයා, අංක 334/1, බඹරවාන, දෙහිඅත්තකණ්ඩිය

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් ලෙස දීර්ඝ කාලයක් සේවය කරන පී.ඒ.එම්. රත්නපාල, එච්. එම්. නිමල් ශාන්ත, ආර්. ඩී. මහින්ද රාජපක්ෂ, ලසිත සෙනරත් විජේසුන්දර, එච්. එම්. චන්දන කුමාර, ඩබ්. ජී. ක්‍රිෂාන් විල්පොල යන සේවකයින්ගේ සේවය ස්ථිර නොකිරීමෙන් එම සේවකයින්ට අසාධාරණයක් සිදු වී තිබේද? සිදු වී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 955

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.